

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2000 අංක 48 දරන මහර සමාජ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සභාගතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2000 අගෝස්තු මස 18 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 6.75 යි. **තැපැල් ගාස්තුව : රු. 3.50 යි.**

2000 අංක 48 දරන මහර සමාජ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සභානිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 18 වන දින.]

එල්. ඩී. – ඕ 59/98.

මහර සමාජ සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"මහර සමාජ සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එහි පරමාර්ථ සහ ඊට අදාල කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවෙහි පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

සුහුඩු නාමය.

1. මේ පනත 2000 අංක 48 දරන මහර සමාජ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මහර සමාජ සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

2. මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන මහර සමාජ සංවර්ධන පදනමෙහි දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "මහර සමාජ සංවර්ධන පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තවද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ශ්‍රී ලංකාව තුළ ප්‍රජා සුභසාධන, සංස්කෘතික සහ සමාජ සංවර්ධන ව්‍යාපෘති ආරම්භකොට පවත්වාගෙන යාම ;

(ආ) මාර්ග සංවර්ධන සහ නිවාස යෝජනා ක්‍රම, ආරෝග්‍යශාලා, පාඨශාලා සහ වෙනත් අධ්‍යාපන මධ්‍යස්ථාන සහ ප්‍රජා මධ්‍යස්ථාන ඉදිකිරීම වැනි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම ;

(ඇ) යම් ව්‍යක්තියකට, රක්ෂාවකට හෝ සේවයකට ඇතුළත්වීමේ, හෝ නිරතවීමේ අවස්ථා දිළිඳු දරුවන්ට සැලසීම සහ ඔවුන්ට මූල්‍ය සහ වෙනත් ආධාර සැපයීම ;

(ඈ) ජාතිය සහ ආගම නොතකා ජනතාව අතර අන්‍යොන්‍ය අවබෝධය සහ සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) අධ්‍යාපනය සහ දැනීම වැඩිදියුණු කිරීම, ව්‍යාප්ත කිරීම සහ ප්‍රචාරය කිරීමේ අදහසින් ශිෂ්‍යාධාර, ශිෂ්‍යත්ව, පැපයීම සහ පාසල්, පුස්තකාල සහ සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා අවශ්‍ය මූල්‍ය හා වෙනත් ආධාර දීම ;

(ඊ) කෘෂිකාර්මික ආනයන, අපනයන, වාණිජ හා වෙනත් අංශවල ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීමෙහි ලා තැනැත්තන් දිරිමත් කිරීම හා ඔවුනට සහාය දීම සහ ඒ තැනැත්තන්ට අවශ්‍ය පුහුණුව හා කාර්මික සහාය ලබා දීම ;

(උ) පරිසරය ආරක්ෂා කිරීම, කළමනාකරණය කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා වූ ව්‍යාපෘතිවලට ආධාර දීම ;

(ඌ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තාවූ වෙනත් යම් විදේශීය හෝ දේශීය ආයතනයක් හෝ සංවිධානයක් සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

(එ) සංස්ථාවේ පරමාර්ථ වැඩිදියුණු කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී සම්මේලන, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමූහ අධ්‍යයන සහ දේශන සඳහා අනුග්‍රහය දැක්වීම සහ ඒවා පවත්වාගෙන යාම ;

(ඒ) ගෘහ කර්මාන්ත සහ ස්වයං සේවා නියුක්ති සඳහා යෝජනා ක්‍රම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ;

(ඔ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීමේ අදහසින් පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීම ; සහ

(ඕ) සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඒ අතුරෙන් යම් පරමාර්ථයක් හෝ මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය, ආනුෂංගික හෝ හිතකර වෙනත් යම් ක්‍රියා සහ දේ කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය, සංස්ථාවේ සාමාජිකයන් අතුරෙන් සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරුන් යම් සංඛ්‍යාවකගෙන් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත සංස්ථාවේ රීතිවලට යටත්ව, පැවරේ.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ ධුර දැරූ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය වන්නේ ය.

සාමාජික නාමලේඛනය.

5. එක් එක් සාමාජිකයාගේ නම, ලිපිනය හා මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි වෙනත් විස්තර ලියා තැබිය යුතු සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

දේපළ අත්කර ගැනීම, අරමුදල් ආයෝජනය කිරීම සහ ණය ගැනීම යනාදිය පිළිබඳ සංස්ථාව සතු බලය.

6. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව :—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, කුලියට ගැනීමට, හා අන්‍යාකාරයෙන් අත්කර ගැනීමට ;

(ආ) සංස්ථාවේ කාර්ය සඳහා මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට ;

(ඇ) විනිමය බිල්පත්, වෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටපත් කිරීමට, ගණුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙනයාමට සහ වැසීමට ;

(ඇ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සුදුසුයයි සලකනු ලබන යම් ආකාරයකින් ආයෝජනය කිරීමට ;

(ඉ) දායක මුදල්, ප්‍රදාන, පරිත්‍යාග සහ සියලු වර්ගවල ත්‍යාග, ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට ;

(ඊ) යම් තැනැත්තකු, සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ සමඟ ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට ;

(උ) නීත්‍යානුකූල භාර කිසිවක් සහ යම් වංචල හෝ නිශ්චල දේපළකට බලපාන නීත්‍යානුකූලභාර හා කොන්දේසි පිලිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට ;

(ඌ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහකිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීමට ;

(එ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි හෝ සේවක පිරිස් පුහුණු කිරීමට ; හා

(ඒ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූල වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීමට

සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ රැකි.

7. (1) සංස්ථාව විසින් යම් සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් හෝ සඳහා කලින් කල සැදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) මණ්ඩලය තෝරා පත් කර ගැනීම, අධ්‍යක්ෂවරුන් ධුර අත්හැර යෑම ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ මණ්ඩලයේ බලතල, කාර්ය, කර්තව්‍ය සහ වර්යාව ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන් සේවයේ යෙදවීම, ඔවුන් සේවයෙන් නෙරපීම සහ ඔවුනට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය සහ වර්යාව ;

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම්වලදී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, එම රැස්වීම්වලදී පුරප්පාඩු පිරවීම, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ඒ රැස්වීම් සඳහා ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම ;

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ රීති, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ රීති, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන අන්දමටම එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිවිජ්ජන්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල්.

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්ථවරණ, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියළු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම්.

9. (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව ගිණුම් නිසි අයුරින් පවත්වාගෙන යාමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සෑම වර්ෂයකදීම යටත් පිරිසෙයින් එක් වරක් සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට විගණනය කළ යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

10. මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයෙහි පදනමෙහි පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට පදනමට ලැබිය යුතු සියලු ණය, සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් වංචල හා නිශ්චල දේපල දැරිය හැකි බව.

11. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් මත හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත සතු කර දෙනු ලබන වංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙහිලා හැකියාව හා ශක්තුතාව ඇති අතර සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීති වලට යටත්ව ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ, හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

12. මණ්ඩලයේ සභාපතිවරයා සහ ලේකම්වරයා හෝ මණ්ඩලය විසින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු හෝ ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් මවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමාකිරීම.

13. සංස්ථාවේ කිසිම සාමාජිකයෙක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔවුන්ගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

විසුරුවා හැරීමේදී ඉතිරිවන දේපළ.

14. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කරනු ලබන්නා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

15. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් සහ ඔවුන් යටතේ නිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

16. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දයක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දයක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.